# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2074/36 - 2018 ජුනි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2018.06.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනිමේ පනත (460 වැනිපරිච්ජේදය)**

**07 වැනි වගන්තිය යටතේ දැන්වීම**

*මගේ යොමු අංකය:-4/1/1/32-D.*
*ඉඩම් අමාත්‍යාශයේ යොමු අංකය:-4-3/7/2015/HW/302.*

පොදුජන කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම් පරවශතාවයන් රජයට අත්කරගෙන ඇත. ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනතේ 07 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් දන්වා සිටිමි.

අත්කරගෙන ඇති ඉඩම් විස්තරය,

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 823 නයිලිය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නයිලිය ගමේ පිහිටි සර්වේ ජෙනරාල් වෙනුවෙන් කුරුණෑගල කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක කු 2394 හා 2018.05.16 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 සිට 05 දක්වා වූ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4520 ක් වූ පහත දක්වා ඇති ඉඩම් කැබලි පහ (05).

**කැබලි අංක 01**

ඉඩමේ නම: රේග්ලන්ඩ්වත්ත; ඉඩම් පරිහරණය: මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත**;** හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: බෝයගනේ, බෝගමුව පාර, සිංහපුර, අංක341/2B හි පදිංචි ඒ.පී. ලක්ෂමන් ඒකනායක; ප්‍රමාණය:- හෙක්ටයාර් 0.0240

**කැබලි අංක 02**

ඉඩමේ නම: රේග්ලන්ඩ්වත්ත; ඉඩම් පරිහරණය:- මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත**;** හිමිකම් පාන්නා:- රජය; මුල් හිමිකම් පාන්නා:- දොරටියාව,මායිම් පාරේ,හි පදිංචි ඩබ්ලිව්.ඒ.ඩී. ප්‍රියන්ගා කුමුදුනි; ප්‍රමාණය:- හෙක්ටයාර් 0.1276

**කැබලි අංක 03**

ඉඩ මේනම: රේග්ලන්ඩ්වත්ත; ඉඩම් පරිහරණය: වත්ත**;** හිමිකම් පාන්නා:- රජය; මුල් හිමිකම් පාන්නා: දොරටියාව,කෝන්පොල හි පදිංචි එම්. හේරත් ගුණසිංහ; ප්‍රමාණය:- හෙක්ටයාර් 0.1028

**කැබලි අංක 04**

ඉඩමේ නම: රේග්ලන්ඩ්වත්ත; ඉඩම් පරිහරණය: වත්ත, ළිඳක කොටසක් ඇත**;** හිමිකම් පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා: කුරුණෑගල,වැහැර, මසන්වත්ත, අංක 240/1 හි පදිංචි ඩබ්ලිව්. එම්.සන්ධ්‍යා ප්‍රියානි වීරසේකර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0924

**කැබලි අංක 05**

ඉඩමේ නම: රේග්ලන්ඩ්වත්ත; ඉඩම් පරිහරණය: මිශ්‍ර වගාවක් සහිත ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක්, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක් සහ ළිඳක කොටසක් ඇත**;** හිමික පාන්නා: රජය; මුල් හිමිකම් පාන්නා:කුරුණෑගල, තල්කොට,සිංහපුර, 10 වෙනි පටුමග, අංක 338B හි පදිංචි ඩබ්ලිව්. එම්. චන්දිමා ප්‍රියදර්ශනී වීරසේකර; ප්‍රමාණය:- හෙක්ටයාර් 0.1025.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම ඉඩම්/පරවශතාවන් කැබලි සඳහා අයිතිවාසිකම් කියන සියලු දෙනාම තමන්ගේ නම් *ගැසට් පත්‍රයේ* පළවී ඇතත්, නැතත් එම ඉඩම්/පරවශතාවන් සම්බන්ධයෙන් තමන්ට ඇති අයිතිවාසිකම්, එක් එක් බිම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම ; පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් එම ඉඩම්වලට/පරවශතාවන් ඇති ස්වකීය අයිතියේ ස්වභාවය, එම ඉඩම්/පරවශතාවන් කැබලිවල අයිතිය වෙනුවෙන් තමන්ට ඉදිරිපත් කළහැකි කරුණු පිළිබඳ විස්තරයක් ..................... දින මගේ කාර්යාලයේ දී මා හමුවී ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව ........................ දින සිට මා විසින් දැනුම් දෙනු ලබන දිනයක දී තමන් විසින් ම නැතහොත් ලිඛිතව බලය පවරනු නියෝජිතයෙකු මගින් නියමිත දින නියමිත වේලාවට, අදාළ ඔප්පු හා මා විසින් නියම කරනු ලබන අනෙකුත් ලියවිලි සමග මා විසින් නියම කරනු ලබන ස්ථානයක දී පනතේ 09 වැනි වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතුය.

පරීක්ෂණය සඳහා නියෝජිතයෙකු ඉදිරිපත් කරන්නේ නම් ඉඩම් හිමිකම් කියන්නා විසින් බලයපවරන ලද ලිපියක් නොමැතිව ඔහුගේ/ඇයගේ ප්‍රකාශ හෝ සාක්ෂි සටහන් කරගනු නොලබන බව අවධාරණය කරමි.

ඊ.එම්.එම්.එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම්අත්කර ගැනීමේ නිලධාරි,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2018.
කුරුණෑගල,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06-843

## ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 07 වැනි වගන්තිය යටතේ දැන්වීම (ශුද්ධි පත්‍රය)

*මගේ යොමු අංකය* :-කු 3/6/2016/8
*ඉඩම් අමාත්‍යාශයේ යොමු අංකය* :-4-3/7/2016/එච්ඩබ්ලිව්/111

මා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2065/28 හා 2018 අප්‍රේල් 04 බදාදා දිනැති අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 07 වැනි වගන්තිය යටතේ දැන්වීමෙහි සඳහන් මූලික පිඹුරු අංකය කු. 1497 යන්න මූලික පිඹුරු අංක කු.1493 වශයෙන් සංශෝධනය කරනු ලබන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කරගැනීමේ නිලධාරි,
පොල්ගහවෙල,

2018 මැයි මස 31 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

06-844

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.